පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව - උතුරු මැද පළාත.
மாகாணக் கல்வித் திணைக்களம் - வட மத்திய மாகாணம்
DEPARTMENT OF EDUCATION – NORTH CENTRAL PROVINCE

# දෙවන වාර පරීක්ෂණය - 2019

| ශ්‍රේණිය |
| --- |
| 08 |

විෂයය **බුද්ධ ධර්මය**

පාසලේ නම : ....................................................................................

ශිෂ්‍ය ශිෂ්‍යාවගේ නම/ ඇතුළත්වීමේ අංකය : ....................................................

....................................................

කාලය : පැය **02** යි.

- **අංක 01 සිට 10 දක්වා ප්‍රශ්නවලට දී ඇති පිළිතුරු අතරින් වඩාත් නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

01. දෙව්දත් කුමරු පැවිදි බව ලබා ගත්තේ,
(1) ගෝසිංග නම් සාල වනයේදී ය.
(2) අනුපිය නම් අඹ වනයේදී ය.
(3) උපවර්තන නම් සල් උයනේදී ය.

02. 'පච්චත්තං වේදිතබ්බෝ විඤ්ඤූහී ' යන දහම් ගුණයෙන් අර්ථවත් වන්නේ,
(1) ධර්මය මුල, මැද, අග පිළිවෙලින් දේශනා කර ඇති බව යි.
(2) තමාගේ වැඩ කටයුතු සියල්ල පසෙකින් තබා වුවද සිතට නගා ගත හැකි බව යි.
(3) තමාගේ ම නුවණින් තමන් විසින් ම අවබෝධ කර ගත යුතු දහමක් බව යි.

03. 'කිරි කඩ හේල' පිළිගැන්වීම සිදු කරනු ලබන්නේ,
(1) අත්පොත් තැබීමේ අවස්ථාවකදී ය.
(2) උපන්දින උත්සවයක් සමරන අවස්ථාවකදී ය.
(3) සරණ මංගල්‍ය අවස්ථාවකදී ය.

04. අංගුලිමාල කතා පුවතින් ඉස්මතු වන්නේ, බුදුරජාණන් වහන්සේ තුළ පැවති,
(1) අරහං ගුණය යි.
(2) අනුත්තර පුරිසදම්මසාරථී ගුණය යි.
(3) සත්ථා දේව මනුස්සානං ගුණය යි.

05. බුදු සසුනේ 'ධර්ම සේනාධිපති' තනතුර ද, ප්‍රඥාවන්තයින් අතර අග්‍රස්ථානය ද, දැරූ මහ රහතන් වහන්සේ වන්නේ,
(1) සැරියුත් මහ රහතන් වහන්සේ ය.
(2) මහා කාශ්‍යප මහ රහතන් වහන්සේ ය.
(3) මුගලන් මහ රහතන් වහන්සේ ය.

06. වරද වරද ලෙස දැකීමත්, වරද දැක එයින් අත් මිදීමට අදාළ ක්‍රියාමාර්ග අනුගමනය කිරීමත්,
(1) කරුණාවන්තයින්ගේ ලක්ෂණයකි.
(2) ඥානවන්තයින්ගේ ලක්ෂණයකි.
(3) ශ්‍රද්ධාවන්තයින්ගේ ලක්ෂණයකි.

07. භික්ෂූන් වහන්සේලාට අදාළ සිරිත් විරිත් හෙවත් සේඛියා ධර්ම ඇතුළත් වන්නේ,
(1) විනය පිටකයේ ය.
(2) සූත්‍ර පිටකයේ ය.
(3) අභිධර්ම පිටකයේ ය.

08. බෞද්ධයෙකු විසින් පොහෝ දිනයකදී සිදු කරන විශේෂ කාර්යයක් විය යුත්තේ,
(1) විනෝද චාරිකාවල යෙදීම යි.
(2) අකුසලින් වැළකී කුසල් දහම් රැස් කිරීම යි.
(3) විවේකීව කාලය ගත කිරීම යි.

09. සාමණේර හිමි නමක් විසින් ආරක්ෂා කරනු ලබන සීලය වන්නේ,
(1) දස සීලය යි.
(2) පංච සීලය යි.
(3) අෂ්ටාංග සීලය යි.

10. ''ස්වාමීනි, සම්බුද්ධ ශාසනයෙන් අඩක් පමණ පවතින්නේ කල්‍යාණ මිත්‍ර ආශ්‍රය නිසා නේදැ ?'' යි යනුවෙන් බුදුරජාණන් වහන්සේගෙන් අසා වදාළේ,
   (1) සැරියුත් තෙරුන් වහන්සේ ය.
   (2) මුගලන් තෙරුන් වහන්සේ ය.
   (3) ආනන්ද තෙරුන් වහන්සේ ය.

- **අංක 11 සිට 15 දක්වා ප්‍රකාශවල හිස්තැනට අදාළ නිවැරදි පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.**

  **( තණ්හාව, දේව ධර්ම, නන්දිවිසාල, පංචානන්තරීය, උපාලි)**

11. තිරිසන් සතුන් පවා ප්‍රිය වචනයට අවනත බව ............................ ජාතකයෙන් පැහැදිලි වේ.
12. මිනිසුන් ................................ට වහල් වීමෙන් බොහෝ විපත්වලට මුහුණ දෙති.
13. සංඝ භේදය ඇති කිරීම ................................ පාප කර්ම ගණයට අයත් වේ.
14. තමා බෞද්ධයෙකු ලෙස පිළිගන්නා ලෙස බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ ................. ගෘහපතියා ය.
15. හිරි ඔත්තප්ප හෙවත් ලැජ්ජාව හා බය .......................... යනුවෙන් ද හඳුන්වයි.

- **ප්‍රශ්න අංක 16 සිට 20 දක්වා ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද, වැරදි නම් (✕) ලකුණ ද යොදන්න.**

16. දෙමාපියන්ගේ අවසරයකින් තොරව කුඩා දරුවන් පැවිදි නොකරන ලෙස සුදොවුන් රජු බුදුරජාණන් වහන්සේගෙන් ඉල්ලා සිටියේ ය. (      )
17. 'ඇම පමණින් පැවසූ මුනි දැන තතු ..... ' කවිය බුදුගුණාලංකාරය නම් ග්‍රන්ථයේ ඇතුළත් වූවකි. (      )
18. උග්ගහ සිටුතුමා තම දියණිවරුන් පස් දෙනා විවාහ කර දුන්නේ බුද්ධ ප්‍රමුඛ මහා සංඝරත්නයට මහ දන් පැවැත්වීමෙන් අනතුරුව ය. (      )
19. අරියවංශ ධර්ම දේශනා පැවැත්වීම ජෛන ආගමිකයින්ගේ චාරිත්‍රයකි. (      )
20. පන්සිය පනස් ජාතක පොත ලියැවී ඇත්තේ අනුරාධපුර යුගයේදී ය. (      )

(ලකුණු 2×20=40)

# II පත්‍රය

01. වකුගඩු රෝගයෙන් මිදීම සඳහා ඔබ පාසලේ ස්ථාපිත කිරීමට නියමිත පිරිසිදු පානීය ජල ව්‍යාපෘතිය විවෘත කිරීමේ උත්සවයට සහභාගී වෙමින් කටයුතු කිරීමට ඔබට අවස්ථාව ලැබුණොත් යැයි සිතා, පහත සඳහන් ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

i. එහිදී ඔබට කළ හැකි කාර්යයන් **තුනක්** ලියන්න. (ලකුණු 03)

ii. මෙම පානීය ජල ව්‍යාපෘතිය තුළින් ප්‍රයෝජන ලැබිය හැකි පාර්ශව **තුනක්** ලියන්න. (ලකුණු 03)

iii. මෙම ජල ව්‍යාපෘතිය රැක ගෙන ඉදිරියට පවත්වාගෙන යාම සඳහා ඔබට කළ හැකි කාර්යයන් **හතරක්** ලියන්න. (ලකුණු 04)

iv. මෙම ජල ව්‍යාපෘතියෙන් සැලසෙන සේවාවන් **තුනක්** ලියන්න. (ලකුණු 06)

v. සහජීවනයෙන් කටයුතු කරන ජාතියක් ලෙස අන් අයගේ සුබ සිද්ධිය උදෙසා ඔබට කළ හැකි මෙවැනි කාර්යයන් **හතරක්** ලියන්න. (ලකුණු 04)

02.

i. බුදු සසුනේ අග්‍ර ශ්‍රාවකයින් වහන්සේලාගේ ගිහි නම් ලියන්න. (ලකුණු 02)

ii. සෘද්ධි බලය යොදා ගනිමින් මුගලන් මහ රහතන් වහන්සේ විසින් සිදු කළ පරමාදර්ශී කාර්යයන් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. සැරියුත් මහ රහතන් වහන්සේගෙන් බුදු සසුනට සිදු වූ සේවාව අගයමින් උන්වහන්සේ පිළිබඳ විස්තරයක් කරන්න. (ලකුණු 05)

03.

i. බුදුරජාණන් වහන්සේ විසින් භික්ෂූන් වහන්සේලාට සේඛියා ධර්ම පැනවීමෙන් අපේක්ෂා කළ අරමුණු දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. තොටගමුවේ ශ්‍රී රාහුල හිමියන් විසින් රචිත කාව්‍යශේඛරයේ සඳහන් 'පෙකණිය නොදක්වා....' යන කවිය සම්පූර්ණ කරන්න. (ලකුණු 03)

iii. එදිනෙදා ජීවිතයේදී ඇඳුම් පැළඳුම් භාවිතය හා ගමන බිමන පිළිබඳ අප සැළකිලිමත් විය යුතු ආකාරය විස්තර කර ලියන්න. (ලකුණු 05)

04.

i. චාරිත්‍ර වාරිත්‍ර යනුවෙන් අදහස් වන්නේ මොනවාද? (ලකුණු 02)

ii. බෞද්ධ චාරිත්‍ර වාරිත්‍ර අනුගමනය කරන ජීවිතයේ වැදගත් අවස්ථාවන් තුනක් ලියන්න. (ලකුණු 03)

iii. බෞද්ධ සිරිත් විරිත්වලට අනුව කටයුතු කිරීම පුද්ගලයාගේ හා සමාජයේ යහපතට හේතුවන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 05)

05.

i. මහෞෂධ කුමරුන් විසඳු ගැටලු දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. මහෞෂධ කුමරා වේදේහ රජුගේ උපදේශක තනතුරට පත් කර ගැනීම වැළැක්වීමට උත්සාහ කළ පඬිවරු තිදෙනෙකු නම් කරන්න. (ලකුණු 03)

iii. ඔබට ඇතිවන විවිධාකාර ප්‍රශ්න ගැටලු හමුවේ මහෞෂධ කුමරු සේ නුවණින් විමසා බලා, ඒවා සාර්ථකව විසඳා ගැනීමට කටයුතු කළ හැකි ආකාරය විස්තර කරන්න. (ලකුණු 05)

06.

i. 'සත්ත්වයාගේ මරණය සතරාකාර බව බුදු දහමේ සඳහන් වේ.' ඒ අතරින් දෙකක් ලියන්න. (ලකුණු 02)

ii. ජාති, ජරා, ව්‍යාධි යන්නෙහි අර්ථයන් වෙන වෙනම ලියන්න. (ලකුණු 03)

iii. එදිනෙදා ජීවිතයේදී දුක් පැමිණිය හැකි ආකාරයත් ඒවාට සාර්ථකව මුහුණදීමට අපට කළ හැකි කාර්යයන් පිළිබඳවත් විස්තර කරන්න. (ලකුණු 05)

07.

i. 'තණ්හාය ජායතී සෝකෝ........' යන්නෙහි අර්ථය ලියන්න. (ලකුණු 02)

ii. තණ්හාව හේතුවෙන් බහු භාණ්ඩිකත්වයට හුරු වූ පුද්ගලයෙකු තුළ දැකිය හැකි ලක්ෂණ තුනක් ලියන්න. (ලකුණු 03)

iii. තණ්හාවට වසඟ වූ සිත තමාට ද, සමාජයට ද භයානක විපත් පමුණුවයි විස්තර කරන්න. (ලකුණු 05)

* * *

**දෙවන වාර පරීක්ෂණය 2019**
**බුද්ධ ධර්මය**
**8 ශ්‍රේණිය**

1. (2) - අනුපිය නම් අඹ වනයේදීය
2. (3) - තමාගේම නුවණින් තමන් විසින්ම අවබෝධ කරගත යුතු දහමක් බවයි
3. (3) - සරණ මංගල්‍ය අවස්ථාවකදී ය
4. (2) - අනුත්තර පරිසධම්මසාරථී ගුණය යි
5. (1) - සැරියුත් මහරහතන් වහන්සේ ය
6. (2) - ඥානවන්තයින්ගේ ලක්‍ෂණයකි
7. (1) - විනය පිටකයේ ය
8. (2) - අකුසලින් වැළකී කුසල් දහම් රැස් කිරීමයි
9. (1) - දස සීලය යි
10. (3) - ආනන්ද තෙරුන් වහන්සේය
11. නන්දිවිසාල
12. තණ්හාව
13. පංචානන්තරීය
14. උපාලි
15. දේව ධර්මය
16. (✓)
17. (×)
18. (✓)
19. (×)
20. (×)

# 11 කොටස

01. i - v දක්වා ප්‍රශ්නවලට සුදුසු පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න

02.

i. සැරියුත් මහරහතන් වහන්සේ - උපතිස්ස
මුගලන් මහරහතන් වහන්සේ - කෝලිත

ii. මච්ඡරිය කෝසිය සිටුතුමා මසුරුකමින් මුදවාලීම
නොමග ගිය දේවදත්ත පාක්ෂික භික්ෂූන් සුමඟට ගැනීම
නන්දෝපනන්ද නාගරාජයා දමනය කිරීම ..... ආදි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (45 පිටුව)

iii. (44 - 45 පිටු) නිවැරදි විස්තරයක් සපයා ඇතිනම් ලකුණු ලබාදෙන්න.

03.

i. භික්ෂු සමාජය තුළ ප්‍රසාදජනක පැවැත්මක් ඇති කරවීමට
භික්ෂු සමාජය තුළ පවිත්‍රත්වය ගොඩනැංවීමට
සෞඛ්‍ය සම්පන්නතාව හා ශිෂ්ඨත්වය ආරක්ෂා කිරීමට ......... ආදි කරුණු අතරින් දෙකක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (54 - 58 පිටු)

ii. ''පෙකණිය නොදක්වා
සළු ඇඳ බොලට දක්වා
නොපව තන සක්වා
සිනා නොමසෙන් දසන් දක්වා''

iii. නිවැරදි විස්තරයක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න. (54 - 58 පිටු)

04.

i. සිරිත් - විරිත් හෙවත් කළ යුතු හා නොකළ යුතු දේ

ii. අත් පොත් තැබීම, උපන්දින අවස්ථා, සරණ මංගල්‍ය උත්සව, දානමය පිංකම් ආදි පිළිතුරු ලියා ඇත්නම් ලකුණු

iii. (23-31 පිටු) ගැළපෙන විස්තරයක් කර ඇත්නම් ලකුණු ලබා දෙන්න.

05.

i. දණ්ඩක ප්‍රශ්නය
වැලියොත් ප්‍රශ්නය

ii. සේනක
පුක්කුස
කාවින්ද
දේවින්ද යන නම් අතරින් තුනක් ලියා ඇත්නම් ලකුණු ලබාදෙන්න

iii. නිවැරදි විස්තරයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න (78 - 81 පිටු)

06.

i. ආයුෂ ගෙවී යාම (ආයුක්ඛය), කර්මය ගෙවී යාම (කම්මක්ඛය)

ii. ඉපදීම, වයස්ගතවීම, රෝග පීඩාදීන්ට ලකවීම යන කරුණු පිළිවෙලින් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න.

iii. නිවැරදි විස්තරයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (88 - 93 පිටු)

07.

i. ''තණ්හාවෙන් ශෝකය ඇතිවේ''

ii. අධික බලාපොරොත්තු තබා ගන්නෙකු වීම
සැහැල්ලු දිවි පැවැත්මෙන් තොර වීම
ලද දෙයින් සතුටු නොවීම
අධි පාරිභෝජන රටාවකට හුරු වී සිටීම

iii. නිවැරදි විස්තරයක් ලියා ඇත්නම් ලකුණු ලබා දෙන්න. (95 - 99 පිටු)